පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - නාට්‍ය හා රංග කලාව

සතිය- 01

ශ්‍රේණිය - 08

Prepared by- ඩබ්.සුජිත් ප්‍රියන්ත

# නාට්‍යෝපකරණ

- නාට්‍යෝපකරණ ආහාර්ය අභිනයට අයත්වේ.නාට්‍ය රඟ දැක්වීම සඳහා නළු නිලියන් භාවිතයට ගන්නා රංග භාණ්ඩ මේ ගණයට අයත්වේ.

  උදා :-විවිධ බඳුන් වර්ග,ආසන ( සිංහාසන),පොත් කඩු,දුනු,ඊතල,හෙල්ල,පලිහ,තුවක්කු,මුගුර,යෂ්ටිය යනාදිය.

- නාට්‍යෝපකරණ නිර්මාණය කිරීමේදී සැලකිය යුතු කරුණු.

  1.අවස්ථාවට උචිත විය යුතුයි.(යුගය,කාලය)
  2.සැහැල්ලු විය යුතුය. (නිෂ්පාදක වරයාගේ හා භාවිතාකරන නළු නිලියන්ගේ රුචිය අනුව )
  3.සරල විය යුතුය.( ලාභදායී වීම,නිෂ්පාදන පිරිවැය අවම වීම )
  4.දීර්ඝ කාලීන පැවැත්ම.( නාට්‍ය දර්ශන රාශියක් සඳහා භාවිතා කලහැකිවීම)
  5.වර්ණ ගැලපීම.
  6.නිර්මාණාත්මක බව
  7. හැකිතාක් ඉවතලන ද්‍රව්‍ය භාවිතය. (ප්ලාස්ටික් බෝතල්,ලෑලි,ඇලුමිනියම් තහඩු, කාර්ඩ් බෝර්ඩ්,සිමෙන්ති කවර) වැනි දෑ

  පැවරුම :-
  1.ඔබ නරඹා හෝ කියවා ඇති නාට්‍ය වල නාට්‍යෝපකරණ 5ක් ලියන්න.
  2.ඔබ කැමති නාට්‍යක් සඳහා සරළ නාට්‍යෝපකරණයක් නිර්මාණය කරන්න.
  ( නිර්මාණය කරන උපකරණය සඳහා හැකිතාක් ඉවත ලන අමු ද්‍රව්‍ය භාවිතා කරන්න.)
  3.නිර්මාණය සඳහා භාවිතයට ගත් අමු ද්‍රව්‍ය ලියන්න.

- ඔබ විසින් සිදු කල නිර්මාණය විෂයභාර ගුරුහවතාට පෙන්වන්න.